ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - 6 වන මට්ටම

අන්තර්ජාතික මානව හිමිකම් නීතිය LLU6717

අඛණ්ඩ ඇගයුම් පරීක්ෂණය II 2021/2022

කාලය - පැය එකයි (01)

| | |
|---|---|
| දිනය - 2022 සැප්තැම්බර් 15 | වේලාව - පෙ.ව 9.30-10.30 |

එක් (01) ප්‍රශ්නයක් සඳහා පමණක් පිළිතුරු සපයන්න.

(1) *එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අරමුණු වන්නේ*

*[...] 3. ආර්ථික, සමාජ, සංස්කෘතික හෝ මානුෂීය ස්වභාවයේ අන්තර්ජාතික ප්‍රශ්න විසඳීමෙහිලා ජාත්‍යන්තර සහයෝගීතාවය ඇති කරගැනීම, සහ වර්ගය, ස්ත්‍රී පුරුෂභාවය, භාෂාව හෝ ආගම බඳු වූ කිසිදු වෙනස් කිරීමකින් තොරව සියලු දෙනා සඳහා මානව හිමිකම් හා මූලික නිදහස සඳහා වූ ගරුත්වය ප්‍රවර්ධනය හා ධෛර්යයමත් කිරීම.*

1(3) වගන්තිය එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය

මානව හිමිකම් සඳහා වූ ගරුත්වය ප්‍රවර්ධනය හා දිරි ගැන්වීම එක්සත් ජාතීන්ගේ සංවිධානය නිර්මාණය කිරීමේ එක් ප්‍රාරම්භක අරමුණකි. මානව හිමිකම් සම්මතයන් (norms) විකාශනය කිරීම සම්බන්ධයෙන් වූ භූමිකාව කෙරෙහි අවධානය යොමු කරමින්, පශ්චාත් දෙවන ලෝක යුද කාලය තුල, එක්සත් ජාතීන්ගේ සංවිධානය මානව හිමිකම් ආරක්ෂාව සඳහා වූ අන්තර්ජාතික ක්‍රමවේදයක් නිර්මාණය කිරීමට දායක වී තිබෙන ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

(2) '...සියලුම මිනිස් අයිතිවාසිකම් විශ්වීයය, බෙදිය නොහැක, අන්‍යෝන්‍ය වශයෙන් රඳා පවතී, අන්තර් සම්බන්ධිතය. ජාත්‍යන්තර ප්‍රජාව මානව හිමිකම් ගෝලීය වශයෙන් සාධාරණ හා සමාන ලෙසකට එකම තත්වයෙහිලා සැලකිය යුතුය, සියලු ආකාරවල මානව හිමිකම්වලට සමාන අවධාරණයක් ලබා දිය යුතු වේ.'

\- වියනා ප්‍රකාශනය හා ක්‍රියාකාරී සැලැස්ම (1993)

මානව හිමිකම් විවිධ පරම්පරාවන් අනුව වර්ගීකරණය කිරීමේ සංකල්පය ආශ්‍රයෙන් සියලුම මිනිස් අයිතිවාසිකම්වල විශ්වීයත්වය, අන්තර් රඳියාව හා අන්තර් සම්බන්ධය යනුවෙන් අදහස් වන්නේ කවරක් දැයි විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

***